…………. Proof

(හයවැනි පාර්ලිමේන්තුව — සිව්වැනි සභාවාරය)

අංක. 23.]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

**2009 අගෝස්තු මස 21 වැනි සිකුරාදා පූ. භා. 9.30 ට**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0060/'09

1.

ගරු රවි කරුණානායක මහතා,— ජාතිය ගොඩනැගීමේ සහ වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) සුනාමිය හේතුවෙන් මිය ගිය පුද්ගලයින් සංඛ්‍යාව කොපමණද;

(ii) සුනාමිය හේතුවෙන් අවතැන් වූ පුද්ගලයින් සංඛ්‍යාව සහ විනාශ වූ නිවාස සංඛ්‍යාව එක් එක් දිස්ත්‍රික්කයට අදාළව කොපමණද;

(iii) රජය විසින් යළි ඉදි කොට ජනතාවට ලබා දුන් නිවාස සංඛ්‍යාව කොපමණද;

(iv) දේශීය හෝ විදේශීය රාජ්‍ය නොවන ආයතන විසින් යළි ඉදි කර දෙන ලද නිවාස සංඛ්‍යාව එක් එක් දිස්ත්‍රික්කයට අදාළව කොපමණද;

(v) සුනාමිය නමැති විශේෂිත කාරණය හේතුවෙන් රටක් වශයෙන් අප ලද ප්‍රදාන සහ ආධාර ප්‍රමාණය 2005 ජනවාරි 01 වැනි දින සිට මේ දක්වා එක් එක් වර්ෂයට අදාළව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0080/'09

2.

ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි මහතා,— වෙළෙඳ, අලෙවි සංවර්ධන, සමූපකාර හා පාරිභෝගික සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රත්මලාන පැරණි ආහාර ගබඩා ඉඩමේ ගොඩනැගිල්ල තුළ පිහිටුවන ලද ආර්ථික මධ්‍යස්ථානයේ ඉදිකිරීම් සඳහා වැය කළ සම්පූර්ණ මුදල කොපමණද;

(ii) එම වැය කළ මුදල ඒ ඒ අංශ යටතේ වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) පැරණි ආහාර ගබඩා ගොඩනැගිල්ල සඳහා අලුතෙන් එකතු කළ අංශ කවරේද;

(ii) පැරණි ගොඩනැගිල්ලේ කොටස් ඉවත් කරන ලද්දේ ද;

(iii) එසේ ඉවත් කළේ නම්, යකඩ ඇතුළු අනෙක් කොටස්වලට සිදු වූ දෙය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0189/'09

3.

ගරු ජේමසිරි මානගේ මහතා,— ධීවර හා ජලජ සම්පත් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) 2008 ඔක්තෝබර් මාසයේ සිට මේ දක්වා විදේශ ධීවර යාත්‍රා මගින් මෙරට වරායන් හරහා ගොඩබාන ලද තුන්වන කාණ්ඩයේ මාළු ප්‍රමාණය කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) විදේශ ධීවර යාත්‍රා මගින් ගොඩබාන ලද තුන්වන කාණ්ඩයේ මාළුවලින් කොපමණ ප්‍රමාණයක් ධීවර සංස්ථාව විසින් මිල දී ගනු ලැබුවේද;

(ii) එහි වටිනාකම කොපමණද;

(iii) විදේශ ධීවර යාත්‍රාවලින් එසේ මිල දී ගත් මාළු කිලෝග්‍රෑම් එකක මිල කොපමණද;

(iv) එම මාළු කිලෝග්‍රෑම් එකක් අලෙවි කළ මිල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0289/'09

4.

ගරු රංජිත් අලුවිහාරේ මහතා,— අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයත් පිඹුරු අංක 11 දරන උකුවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ රත්වත්ත - කටුදෙණියවත්ත නමැති ඉඩම කේ. ඩී. සෙනවිරත්න නමැති අයට තක්සේරු මුදලකට අනුව නීත්‍යානුකූලව පවරා ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) සෙනවිරත්න මහතාට අයත් මෙම ඉඩමට ප්‍රවේශ මාර්ගය සඳහා ලබා දී තිබූ බිම් කොටසේ ප්‍රාදේශීය සභාව මගින් ජල ටැංකියක් ඉදිකර ඇති බවත්;

(ii) එම නිසා, එම මාර්ගය පරිහරණය කිරීමේ ගැටළු පැන නැගී ඇති බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඇ) කොමිෂන් සභාව සතුව පවතින, දැනට ප්‍රජා ශාලාව හා සෞඛ්‍ය මධ්‍යස්ථානය අතර ඇති බිම් කොටස සෙනවිරත්න මහතාට විකල්ප මාර්ගයක් ලෙස භාවිතා කිරීමට ලබා දෙන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0401/'09

5.

ගරු කේ. වී. සමන්ත විද්‍යාරත්න මහතා,— වාරිමාර්ග හා ජල කළමනාකරණ අමාත්‍යතුමා සහ වරාය හා ගුවන්සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) උමා ඔය ව්‍යාපෘතියේ වැඩ ආරම්භ කරමින් මුල්ගල තැබුවේ කවදාද;

(ii) උමා ඔය ව්‍යාපෘතිය යටතේ ඉදිවන ප්‍රධාන ඉදිකිරීම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) උමා ඔය ව්‍යාපෘතියේ සමාරම්භක උළෙල සඳහා කළ සමස්ත වියදම එක් එක් කාර්ය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) සමාරම්භක උළෙල සඳහා ප්‍රතිපාදන සපයා ගනු ලැබුවේ කෙසේද;

(iii) මෙම ව්‍යාපෘතිය සඳහා මුළු ඇස්තමේන්තුගත මුදල කොපමණද;

(iv) මෙම මුදල සපයා ගන්නා ක්‍රමවේදය කවරේද;

(v) මේ වන විට සපයාගෙන ඇති මුදල් ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) අදාළ ව්‍යාපෘතියේ වත්මන් ප්‍රගතිය කවරේද;

(ii) ව්‍යාපෘතිය අවසන් කිරීමට ඉලක්ක ගත දිනය කවදාද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0510/'09

6\.

ගරු වයි. එම්. නවරත්න බණ්ඩා මහතා,— විද්‍යා හා තාක්ෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2005, 2006, 2007, 2008 සහ 2009 වර්ෂ සඳහා විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශයට අයවැයෙන් වෙන් කළ මුදල් ප්‍රමාණය කොපමණද;

(ii) එම මුදල් ප්‍රාග්ධන හා පුනරාවර්තන ලෙස වෙන් වෙන්ව කොපමණද;

(iii) ඉහත එක් එක් වර්ෂයේ වෙන් කරන ලද මුදල හා ලැබුණු මුදල අතර වෙනසක් තිබේද;

(iv) එසේ නම්, වාර්ෂිකව ඒ කොපමණ ප්‍රමාණයක්ද;

(v) එසේ මුදල් අඩුවී ඇත්නම් ඊට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය යටතේ ඇති ප්‍රධාන ආයතන සංඛ්‍යාව කොපමණද;

(ii) වෙන් වෙන් වශයෙන් එම ප්‍රධාන ආයතන කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0516/'09

7\.

ගරු ජයන්ත විජේසේකර මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) නැගෙනහිර පළාතේ ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය තුළ තිබෙන පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ පාසල්වල සිටින ශිෂ්‍ය සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ඉහත පාසල් අතුරින් විද්‍යාගාර නොමැති පාසල් සංඛ්‍යාව කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0081/'09

8.

ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි මහතා,— රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යතුමා සහ මුදල් හා ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා පරිපාලන සේවයේ II/II පන්තියේ තනතුරු වලට බඳවා ගැනීම 2004/2005 යනුවෙන් තරඟ විභාගයක් පැවැත්වූයේද;

(ii) එසේ නම්, ඒ කවර දිනකද;

(iii) පෙනී සිටි අයදුම්කරුවන් සංඛ්‍යාව කොපමණද;

(iv) පැවති පුරප්පාඩු සංඛ්‍යාව හා පුරවන ලද පුරප්පාඩු සංඛ්‍යාව කොපමණද;

(v) බඳවාගනු ලැබූ අවම ලකුණු ප්‍රමාණය කොපමණද;

(vi) බඳවාගෙන ඉතිරි වූ පුරප්පාඩු සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) පත්වීම් භාර නොගත් හා සේවය අත්හැරයන්නන්ගෙන් ඇතිවන පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා දෙවන වටයට අපේක්ෂකයන් කැඳවීමට පියවර නොගැනීමට හේතු කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0222/'09

9.

ගරු ජේමසිරි මානගේ මහතා,— මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) ලංකා බැංකුවේ කොළඹ තැප්‍රෝබේන් ශාඛාවේ පවත්වාගෙන යනු ලබන භාණ්ඩාගාර ගිණුම් බැංකු අයිරාව 2005 දෙසැම්බර් මස 31 දිනට, 2008 දෙසැම්බර් මස 31 දිනට සහ 2009 ජනවාරි මස 30 දිනට වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) බැංකු අයිරාව මෙතරම් ඉහළ ගොස් ඇත්තේ කවර හේතු නිසාද;

(ii) බැංකු අයිරාව ඉහළ යාම වළක්වා ගැනීමට මේ වන විට ගෙන තිබෙන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0292/'09

10.

ගරු රවි කරුණානායක මහතා,— සංචාරක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මේ දක්වා වූ පසුගිය වසර දහයක කාලය තුළ එක් එක් වර්ෂයේදී;

(i) ශ්‍රී ලංකාව නැරඹීමට පැමිණි සමස්ත සංචාරකයින් සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන්ගේ රටවල් සහ එම සංචාරකයින් මෙරට නැවතී සිටි සාමාන්‍ය කාලසීමාව කොපමණද;

(iii) උපයාගත් මුදල සහ සංචාරකයින් විසින් දරන ලද වියදමේ සාමාන්‍ය අගය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) පසුගිය වසර 10ක කාලය තුළ සෘජුව හෝ වක්‍රව සංචාරක කර්මාන්තයේ නිරතව සිටි ජනතාව කොපමණදැයි එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) මේ දක්වා වූ පසුගිය වසර දහයක කාලය තුළ එක් එක් වර්ෂයේදී;

(i) මෙරට තිබූ හෝටල් කාමර සංඛ්‍යාව කොපමණද;

(ii) එම හෝටල් අයත්වන තරු පංතිය කවරේද;

යන්න එතුමා වැඩිදුරටත් ප්‍රකාශ කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0442/'09

11.

ගරු රංජිත් අලුවිහාරේ මහතා,— ජාතිය ගොඩනැගීමේ හා වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2005 සිට 2009 වර්ෂය දක්වා සෑම වර්ෂයකම ජුනි මස 30 වැනි දිනට මාතලේ දිස්ත්‍රික්කයේ දඹුල්ල මැතිවරණ කොට්ඨාසය තුළ සිටි සමෘද්ධිලාභීන් සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන් ලැබූ මුදල් ප්‍රමාණය අනුව ඉහත පවුල් අයත්වන කණ්ඩායම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) සමෘද්ධිලාභීන් අතර දිළිඳුකම අවමවීමක් සිදුවී තිබේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0517/'09

12.

ගරු ජයන්ත විජේසේකර මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2009 වර්ෂය සඳහා නැගෙනහිර පළාත් සභාව වෙනුවෙන් වෙන්කරන ලද මුදල් ප්‍රමාණය කොපමණද;

(ii) එම වෙන්කරන ලද මුදලින් ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය වෙනුවෙන් කොපමණ මුදලක් වෙන් කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ඉහත වෙන්කරන ලද මුදලින් අධ්‍යාපනය සඳහා වෙන්කරන ලද මුදල් ප්‍රමාණය කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0085/'09

13.

ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි මහතා,— ජනමාධ්‍ය හා තොරතුරු අමාත්‍යතුමා සහ ව්‍යවසාය සංවර්ධන හා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ස්වාධීන රූපවාහිනී ආයතනය (අයි. ටී. එන්) මගින් විකාශනය කරන "තුලාව" දේශපාලන වැඩ සටහන වර්ෂ 2007 සිට 2009 අප්‍රේල් මස 30 වැනි දින දක්වා කාලය තුළ විකාශනය කළ සම්පූර්ණ වාර ගණන කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එකී වැඩසටහන් සාකච්ඡා සඳහා උක්ත කාලය තුළ සහභාගි කරගෙන ඇති සම්පූර්ණ දේශපාලන නියෝජිතයින් සංඛ්‍යාව කොපමණද;

(ii) නිලධාරි මට්ටමේ නියෝජනය සංඛ්‍යාත්මකව කොපමණද;

(iii) අනෙකුත් ක්ෂේත්‍ර නියෝජනය කරමින් සහභාගි වී ඇති සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) අදාළ කාලය තුළ දේශපාලන පක්ෂ අනුව සහභාගී වී ඇති දේශපාලන නියෝජිතයින් සංඛ්‍යාව කොපමණද;

(ii) වැඩිම වාර ගණනක් සහභාගි වී ඇති අයගේ, පිළිවෙළින් පුද්ගලයින් අනුව, වැඩසටහන් නියෝජනය කළ වාර ගණන කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0294/'09

14.

ගරු රවි කරුණානායක මහතා,— විදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2009 මැයි මස 15 වැනි දිනට පෙර සෑම රටක්ම තමාට අයත් සාගර පත්ල ප්‍රදේශයේ අයිතිය පිළිබඳව හිමිකම් පෑමක් සිදු කල යුතුව තිබූ බවත් එතුමා දන්නෙහිද?

(ආ) මෙම අමාත්‍යාංශය ඒ අයුරින් කටයුතු කර තිබේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) එසේ නම්, අදාළ ජාත්‍යන්තර ආයතනය වෙත ඉදිරිපත් කරන ලද ඉල්ලීම එතුමා සභාගත කරන්නෙහිද?

(ඈ) (i) අලුතින් හිමිකම් පා ඇති සාගර පත්ල ප්‍රදේශයේ වර්ගඵලය වර්ග කිලෝමීටර්වලින් කොපමණද;

(ii) එක්සත් ජාතීන්ගේ සංවිධානය හෝ අදාළ ජගත් ආයතනය විසින් එය නිල වශයෙන් වලංගු කරනු ලබන දිනය කවදාද;

යන්න එතුමා වැඩිදුරටත් සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# ප්‍රධාන කටයුතු ආරම්භයේදී

## යෝජනා පිළිබඳ දැනුම්දීම

1.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ රැස්වීම්,— ස්ථාවර නියෝග 7 හි විධිවිධානවල සහ 2009.05.26 වැනි දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවේ කුමක් සඳහන්ව තිබුණ ද, අද දින රැස්වීම පැවැත්වෙන කාල වේලා පූ. භා. 9.30 සිට අ. භා. 4.30 දක්වා විය යුතු ය. අ. භා. 2.30 ට ස්ථාවර නියෝග 7(5) ක්‍රියාත්මක විය යුතු ය.

---

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*1.

සේවක අර්ථසාධක අරමුදල් (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

2.

වාරියපොල රාජමහා විහාර සංවර්ධන සභාව (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

3.

සෙරෙන්ඩිබ් අධ්‍යාපනික භාරය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

4.

සමන්තුරේ තබ්ලීකුල් ඉස්ලාම් අරාබි විද්‍යාලය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

5.

ඉදිරි ලෝකය සංවිධානය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

*6.

ඉන්දියානු ආගාමික කම්කරු (ඉවත්කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*7.

පාර්ලිමේන්තු මැතිවරණ (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*8.

වත්කම්වලින් ආවරණය වූ සුරැකුම්කරණය විධිමත් කිරීමේ පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*9.

රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*10.

ගෙවීම් පැහැර හරිනු ලැබූ බදු (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*11.

ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*12.

ශ්‍රී ලංකා රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා (ඉවත් කිරීමේ) පනත් කෙටුම්පත— දෙවැනි වර කියවීම.

*13.

අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන්හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2008 ජූනි 17) [1]

*14.

ආණ්ඩුකාරවරයන්ගේ විශ්‍රාම වැටුප් පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*15.

ප්‍රතාපන විරෝධී සහ ප්‍රතිතෝලන බදු පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 අප්‍රේල් 04) [1]

*16.

බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 ජූලි 18) [1]

*17.

අක්‍රිය වත්කම් (ආපසු අයකර ගැනීමේ) පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 ජූලි 18) [1]

*18.

සුදු (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 ජූලි 18) [1]

*19.

ආරක්ෂණ පියවර පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 අප්‍රේල් 04) [1]

*20.

සිවිල් ගුවන් සේවා පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*21.

විශ්වවිද්‍යාල (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*22.

සිවිල් නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*23.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ තීරණය (අංක 1),— අංක 6/2006 දරන 2006.04.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ විධිවිධානයන්ට යටත්ව 2006.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි අග්‍රවිනිශ්චයකාරතුමා, ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරුන්, අභියාචනාධිකරණයේ සභාපතිතුමා සහ අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරුන් සඳහා මාසික වැටුප් පහත සඳහන් පරිදි විය යුතු යැයි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 108(1) ව්‍යවස්ථාව යටතේ මෙම පාර්ලිමේන්තුව මෙයින් නිශ්චය කරනු ලබයි.

| | |
|---|---|
| ගරු අග්‍රවිනිශ්චයකාරතුමා | රු. 70,000/- |
| | රු. 1,500/- |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරුන් හා අභියාචනාධිකරණයේ සභාපති | රු. 65,000/- |
| අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරුන් | රු. 63,500/- |

තවද, ශ්‍රේෂ්ඨාධිකරණයේ හා අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරුන්ට ගෙවිය යුතු වැටුප් ලෙස 2004 සැප්තැම්බර් මස 09 වැනි දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර සම්මත කර ගන්නා ලද වැටුප් පරිමාණයන් වෙනුවට මෙම යෝජනාවෙන් නිශ්චය කරනු ලබන වැටුප් ක්‍රියාත්මක විය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව තවදුරටත් නිශ්චය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*24.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ තීරණය (අංක 2),— 2008.07.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි අග්‍රවිනිශ්චයකාරතුමා, ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරුන්, අභියාචනාධිකරණයේ සභාපතිතුමා සහ අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරුන් සඳහා, වැටුපෙන් 25%කට සමාන මාසික පෞද්ගලික දීමනාවක් ගෙවීමට ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 108(1) ව්‍යවස්ථාව යටතේ මෙම පාර්ලිමේන්තුව මෙයින් නිශ්චය කරනු ලබයි.

තවද, ශ්‍රේෂ්ඨාධිකරණ හා අභියාචනාධිකරණ විනිසුරුවරුන්ට ගෙවිය යුතු පෞද්ගලික දීමනාවක් ලෙස පාර්ලිමේන්තුව විසින් 1998 මාර්තු මස 17 වැනි දින සම්මත කරනු ලැබූ දීමනාවන් වෙනුවට මෙම යෝජනාවෙන් නිශ්චය කරනු ලබන පෞද්ගලික දීමනාවන් ක්‍රියාත්මක විය යුතු බව මෙම පාර්ලිමේන්තුව තවදුරටත් නිශ්චය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*25.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ තීරණය (අංක 3),— 2007.08.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි අග්‍රවිනිශ්චයකාරතුමාට, ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරුන්ට සහ අභියාචනාධිකරණයේ සභාපතිතුමාට හා අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරුන්ට පහත සඳහන් පරිදි මාසික ගෙවල් කුලී දීමනා ගෙවිය යුතු බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 108(1) ව්‍යවස්ථාව යටතේ මෙම පාර්ලිමේන්තුව මෙයින් නිශ්චය කරනු ලබයි.

| | |
|---|---|
| ගරු අග්‍රවිනිශ්චයකාරතුමා | රු. 27,500/- |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරුන් හා අභියාචනාධිකරණයේ සභාපති | රු. 25,000/- |
| අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරුන් | රු. 22,500/- |

තවද, ශ්‍රේෂ්ඨාධිකරණයේ හා අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරුන්ට ගෙවිය යුතු ගෙවල් කුලී දීමනාව ලෙස 2004 සැප්තැම්බර් මස 09 වැනි දින පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරනු ලැබූ දීමනාව වෙනුවට මෙම යෝජනාවෙන් නිශ්චය කරනු ලබන ගෙවල් කුලී දීමනාව ක්‍රියාත්මක විය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව නිශ්චය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*26.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ තීරණය (අංක 4),— 2008.07.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි අග්‍රවිනිශ්චයකාරතුමාට, සංග්‍රහ දීමනාව ලෙස මාසිකව රු. 3,500/- ක දීමනාවක් ගෙවීමට ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 108(1) ව්‍යවස්ථාව යටතේ මෙම පාර්ලිමේන්තුව මෙයින් නිශ්චය කරනු ලබයි.

තවද, මෙයට පෙර අගවිනිසුරුවරයා සඳහා පාර්ලිමේන්තුව නිශ්චය කර ඇති සංග්‍රහ දීමනාව වෙනුවට මෙම යෝජනාවෙන් නිශ්චය කරනු ලබන සංග්‍රහ දීමනාව ක්‍රියාත්මක විය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව මෙයින් නිශ්චය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*27.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— සුරා බදු ආඥාපනත යටතේ රීති,— (52 වැනි අධිකාරය වූ) සුරාබදු ආඥාපනතේ 32 වැනි වගන්තිය යටතේ ජනාධිපතිතුමා විසින් සුරාබදු සම්බන්ධයෙන් පනවන ලදුව, 2008 අප්‍රේල් මස 10 දිනැති අංක 1544/17 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2008.06.19 වැනි දින ඉදිරිපත් කරන ලද රීති අනුමත කළ යුතු ය.

*28.

තැපැල් හා විදුලි සංදේශ අමාත්‍යතුමා,— තැපැල් කාර්යාල ආඥාපනත යටතේ ව්‍යවස්ථාව,— (190 වැනි අධිකාරය වූ) තැපැල් කාර්යාල ආඥාපනතේ අංක 12, 21, 25, 27, 81, 62, 06, 39, 49, 44, 68, 67, 40, 24, 59, 60, 35, 59, 67 හා 64 යන වගන්ති යටතේ තැපැල් හා විදුලි සංදේශ අමාත්‍යතුමා විසින් මුදල් අමාත්‍යතුමාගේ එකඟත්වය ඇතිව සම්පාදනය කරන ලදුව, 2007 අප්‍රේල් මස 25 දිනැති අංක 1494/10 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2007.07.17 වැනි දින ඉදිරිපත් කරන ලද ව්‍යවස්ථාව අනුමත කළ යුතු ය.

*29.

සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යතුමා,— වෛද්‍ය ආඥාපනත යටතේ නියෝග,— (105 වැනි අධිකාරය වූ) වෛද්‍ය ආඥාපනතේ 72 වැනි වගන්තිය සමග කියවිය යුතු 19 වැනි වගන්තිය යටතේ සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යතුමා විසින් ශ්‍රී ලංකා වෛද්‍ය සභාව විමසා සාදන ලදුව, 2009 පෙබරවාරි මස 25 දිනැති අංක 1590/13 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2009.04.21 වැනි දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

30.

දහනව වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

31.

උතුර සහ නැගෙනහිර දෙපළාත තාවකාලිකව ඒකාබද්ධ කිරීම අහෝසි කිරීමේ (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

32.

ග්‍රාස්රූට්ස් පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

33.

බලහත්කාරයෙන් ආගම්වලට හරවා ගැනීම තහනම් කිරීමේ පනත් කෙටුම්පත — සලකා බැලීම.

*** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.**

---

**[1]**
" පනත් කෙටුම්පත දැන් දෙවැනි වර කියවිය යුතුය" යනුවෙන් යෝජනා කරන ලදින් ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

---

## වාචික පිළිතුරු අපේක්ෂා නොකරන ප්‍රශ්න

0443/'09

1.

ගරු රංජිත් අලුවිහාරේ මහතා,— ජාතිය ගොඩනැඟීමේ හා වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2005 සිට 2009 වර්ෂය දක්වා සෑම වර්ෂයකම ජූනි මස 30 වැනි දිනට මාතලේ දිස්ත්‍රික්කයේ රත්තොට මැතිවරණ කොට්ඨාසය තුළ සිටි සමෘද්ධිලාභීන් සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන් ලැබූ මුදල් ප්‍රමාණය අනුව ඉහත පවුල් අයත්වන කණ්ඩායම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) සමෘද්ධිලාභීන් අතර දිළිඳුකම අවමවීමක් සිදුවී තිබේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0444/’09

2.

ගරු රංජිත් අලුවිහාරේ මහතා,— ජාතිය ගොඩනැඟීමේ හා වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2005 සිට 2009 වර්ෂය දක්වා සෑම වර්ෂයකම ජුනි මස 30 වැනි දිනට මාතලේ දිස්ත්‍රික්කයේ ලග්ගල මැතිවරණ කොට්ඨාසය තුළ සිටි සමෘද්ධිලාභීන් සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන් ලැබූ මුදල් ප්‍රමාණය අනුව ඉහත පවුල් අයත්වන කණ්ඩායම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) සමෘද්ධිලාභීන් අතර දිළිඳුකම අවමවීමක් සිදුවී තිබේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?